# ඉගෙනුම් අත්වැල
# නාට්‍ය හා රංග කලාව

## 8 ශ්‍රේණිය - 3 වන වාරය



සෞන්දර්ය අංශය
අධ්‍යාපන අමාත්‍යංශය
ඉසුරුපාය
බත්තරමුල්ල

# 06-11 නාට්‍ය හා රංග කලාව විෂය ස්වයං අධ්‍යයන අත්වැල සම්පාදක කණ්ඩායම

අචිනි නයන්තරා මෙය - ගුරු වෘත්තික - ච/ගල්/ඇහැටුවැව බණ්ඩාරනායක ම. වි. මහව.

අශෝක චන්ද්‍රසේකර මයා - ගුරු වෘත්තික - ව/නික/සංඝබෝධි ම. ම. වි. අවුලේගම.

ඉන්දු මැණිකේ මිය - ගුරු වෘත්තික - ච/හලා/ධම්මිස්සර ජා. පා. නාත්තණ්ඩිය.

ගයාන් රන්දීර මයා - ගුරු වෘත්තික - බප/මීනු/සෙනරත් පරණවිතාන ජා. පා, උඩුගම්පොල.

ගාමිණී බස්නායක මයා - ගුරු වෘත්තික - අම්/මහ/මීරිස්වත්ත ද්වී.පා. පදියතලාව.

ජයනි කපුගේ මිය - ගුරු වෘත්තික - බප/කො/සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය, කොළඹ 07.

මහේෂා විජේසිංහ මිය - ගුරු වෘත්තික - මප/ගම්/ශා. ජෝශප් බා.වි. ගම්පොල.

රසිකා රත්නායක මිය - ගුරු වෘත්තික - බප/කො/ක්ලිෆ්ටන් බා. වි. කොළඹ 10.

රංගන වන්නකුආරච්චි මයා - ගුරු වෘත්තික - බප/ගම්/බණ්ඩාරනායක ජා. පා. ගම්පහ.

ලලිත අතාවුද මයා - ගුරු වෘත්තික - බප/ජය/සුභූති ජා. පා. බත්තරමුල්ල.

වරුණ අලහකෝන් මයා - නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.

ශාලිකා රංතිලක මිය - කථිකාචාර්ය, මහරගම ජා.අ.වි. පීඨය, මහරගම.

සරසි පීරිස් මෙය - ගුරු වෘත්තික - සබ/ර/ ප්‍රඥාධීර වි, කහවත්ත.

සුභාෂිනී හේරත් මිය - ගුරු වෘත්තික - උමැ/අ/නිවත්තක චේතිය ම. වි. අනුරාධපුර.

සුරංගි කෝසලා මිය - ගුරු වෘත්තික - බප/පිළි/ පිලියන්දල ම. ම. වි. පිලියන්දල.

සුලෝචනා ප්‍රියදර්ශනී මිය - ගුරු වෘත්තික -මප/නු/ අඹගමුව ම. වි. හැටන්.

# නාට්‍ය පෙළ සංවර්ධනය කිරීම

## 1. නාට්‍යයේ තේමාව

නාට්‍යයට සුදුසු තේමාවක් සපයා ගැනීම පිටපත රචනා කිරීමේ ප්‍රථම කාර්යයි. එදිනෙදා අපට හමුවන අත්දැකීම් ආශ්‍රයෙන් නාට්‍යයකට අදාලව තේමාවක් සපයා ගත හැකියි. තේමාව යනුවෙන් හඳුන්වන්නේ නාට්‍යයේ නම නොවෙන බව දැන ගත යුතු කරුණකි.

සරලව "තේමාව" යන්නට දිය හැකි තේරුම වන්නේ නාට්‍යයක් ගොඩනැගීමට හැකියාව ඇති සිද්ධිමය අවස්ථාවයි. මෙය "වස්තු බීජය" යන්වෙන් හැඳින්වීම ද එතරම් වරදක් නැත.

තේමාව සපයා ගැනීමේදී ආකර්ශණීය බවකින් යුක්ත වීම ඉතා වැදගත් ය. එසේ ඒ ඔස්සේ තර්කානුකූලව විශ්වාසනීයත්වය රැකෙන පරිදි කතාවක් ගොඩනගා ගැනීමට හැකියාව තිබිය යුතුය.

## 2. චරිත ගැලපීම

තේමාවට අදාලව ගොඩනගා ගත් කතාව තුල තර්කානුකූල ව, විශ්වාසනීයත්වය රැකෙන පරිදි චරිත යොදා ගැනීම සිදු විය යුතුය. එසේ ම කිසි සේත් ම අනවශ්‍ය චරිත යොදා නොගත යුතුය. කතාවට අදාළ අවශ්‍ය ම චරිත පමණක් යොදා ගැනීමට වග බලා ගත යුතුය.

එසේ ම චරිතයට අදාල වටපිටාව ගොඩනැගීමේදී ඔහු හෝ ඇයට අදාළ චරිත අනන්‍යතා ඉස්මතු විය යුතුය. එය සංවාද රචනයේ දී සහ හැසිරීම් අවස්ථා නිර්මාණය කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණකි. චරිත අනන්‍යතා යනු චරිතය කතා කරන දේ, හැසිරෙන ආකාරය, විවිධ අවස්ථා වලට ප්‍රතිචාර දක්වන ආකාරය, සිතන පතන ආකාරය, බාහිරව චරිතයේ ස්වභාවය වැනි කරුණු ය.

## 3. යොදාගත් සංවාද හා භාෂාව

සංවාද හා භාෂාව භාවිතයේ දී අප නාට්‍යය සඳහා සුදුසු යැයි තෝරා ගන්නා නාට්‍ය ආකෘතිය ගැන ප්‍රථමව සැලකිලිමත් විය යුතුය. එනම්, ලෝකධර්මී හෝ නාට්‍යය ධර්මී යන්න තෝරා ගත යුතුය.

උදාහරණ ලෙස ලෝකධර්මී නාට්‍යයකට නම් අප එදිනෙදා භාවිත කරන භාෂාව යොදා ගත හැකිය. ගීත ආදිය බාවිතා කිරීම අනවශ්‍යය. නාට්‍යය ධර්මී නාට්‍යයකට නම් කලාන්විත දෙබස්, භාෂාව හැසිරවීමේ ස්වරූපය, ගීත ආදිය භාවිත කිරීම ආදී දේ ගැන අවධානය යොමු කල යුතුය. එසේ ම භාෂාව භාවිත කිරීමේදී නාට්‍යයේ නිරූපණය කෙරෙන කාල වකවානුව පිළිබඳ සැලකිලිමත් විය යුතුය. එසේ ම ජන සමූහයේ සාමාජීයමය අනන්‍යතා ගැන ද සැලකිලිමත් විය යුතුය. එනම් ඔවුන්ටම ආවේණික වූ භාෂාව හැසිරවීමේ වචන, අර්ථය ජනනය කිරීම් පිළිබඳව අවධානය යොමු කල යුතුය.

එමෙන් ම ඒ ඒ පුද්ගලයන්ට අනන්‍යය භාෂා හැසිරවීම පිළිබඳවද සැලකිලිමත් විය යුතුය. උදාහරණ ලෙස හාමුදුරුනමක්, මැරයෙක්, දේශපාලකයෙක්, ශිෂ්‍යයෙක්, ගුරුවරයෙක් ආදිය ගත හැකිය.

4. <u>අවස්ථා හා සිද්ධි</u>

කුඩා සිද්ධි කිහිපයක් එක් වී අවස්ථාවක් නිර්මාණය වේ. නාට්‍යය පුරා දිවෙන අවස්ථා හා සිද්ධි සියල්ල තර්කානුකූල බව ඇති කරමින් විශ්වාසවන්ත සිතුවිලි ප්‍රේක්ෂකයා තුළ ඇති කරන ඒවා විය යුතුය.

එසේ ම විශේෂම කරුණ නම් නාට්‍යට අත්‍යවශ්‍ය හා ගැළපෙන ඒවා වීමයි. එම සිද්ධි හා අවස්ථා පිළිවෙළින් පෙළ ගස්වා ගැනීම ඉතා වැදගත් ය.

මතක තබා ගත යුතු කරුණ නම් නාට්‍යයට අත්‍යවශ්‍යම සිද්ධි සකසා ගෙන ඒ මගින් නාට්‍යයට අත්‍යවශ්‍යම අවස්ථාවක් ගොඩනගා ගැනීමට වග බලා ගැනීමයි. එමගින් ප්‍රේක්ෂක ආකර්ශණය එලෙසම රඳවා ගත හැකිය. ප්‍රේක්ෂක ආකර්ශණය රඳා පවතින්නේ නාට්‍යෝචිත අවස්ථා මතින් ඇති කරන කුතුහලය තුළිනි.

5. <u>ඒවායේ නාට්‍යෝචිත බව</u>

ප්‍රේක්ෂකයාගේ සාමාන්‍ය චින්තනයට සමපාත නොවී නොසිතන ආකාරයේ විශ්වාසනීය අවස්ථා නාට්‍ය තුළ ඇති කිරීම නාට්‍යෝචිත බව යන්න මතුකර පෙන්වයි.

"නාට්‍යෝචිත අවස්ථා" යන්නෙහි සරල අර්ථය නාට්‍යයට ගැළපෙන නමුත් ප්‍රේක්ෂකයා ඒ මොහොතේ සිදුවෙයි කියා නොසිතන අවස්ථාවක් නාට්‍යය තුළ විටින් විට බිහිවීම යි. ඒ හරහා ප්‍රේක්ෂක අවධානය හා ආකර්ශණය නාට්‍ය කෙරෙහි නිරායාසයෙන් ම යොමු වීම සිදුවේ. නාට්‍යයේ ගලා යාමට එය ඉවහල් වේ.

නාට්‍යෝචිත අවස්ථා ප්‍රේක්ෂකයා තුළ රසයක් මෙන් ම කුතුහලයක් ද ඇති කරයි.

6. <u>නාට්‍යයේ ගැටුම</u>

නාට්‍යයේ ගැටුම නට්‍යයේ අවශ්‍යම අංගයයි. "ගැටුමක් නැති තැන නාට්‍යයක් නැත." යන කියමන තුලින් ද එය තහුවරු වේ.

නාට්‍යයේ ගැටුම යන්නෙහි සරල අර්ථය "ප්‍රතිවිරුද්ධ මතවාද දෙකක් එකට හමුවීමයි." නාට්‍යයේ කුඩා කුඩා සිද්ධි තුළ ඇති කෙරෙන ගැටුම් අවස්ථා නාට්‍යය ගලායාම ඇති කරයි.

සෑම විටම ගැටුම යනු රණ්ඩුවක් නොවන බව මතක තබා ගත යුතු කරුණකි. එය යම් ආකල්පමය, මතවාදීමය, සංස්කෘතිකමය, සාමාජීය, දේශපාලනමය හෝ වෙනයම් එකක් විය හැකිය.

නාට්‍යයේ ගැටුම කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය.

* **අභ්‍යන්තර ගැටුම**

  පුද්ගලයාගේ අභ්‍යන්තර සිතුම් පැතුම්, ආකල්ප, ක්‍රියාකාරකම් ආදිය පිළිබඳව ඔහු තුළම ඇතිවන මත ගැටුම. එය සිතුවිලි මගින් ඔහු තුලම ඇතිවේ.

* **බාහිර ගැටුම**

  තවත් පුද්ගලයෙක් සමඟ, කණ්ඩායමක් සමඟ, යම්කිසි දෙයක් සමඟ ඇතිවන විරෝධාකල්පය ප්‍රකාශ කිරීම බාහිර ගැටුම නම් වේ.

නාට්‍යය පිටපත තුල ගැටුම් අවස්ථා නිර්මාණය කිරීමේදී ඒවා තර්කාන්විත වීම අනිවාර්යය කරුණකි. කුඩා ගැටුම් අවස්ථා එකතුවෙන් නාට්‍යයේ විශාල ගැටුමක් ඇති කරයි. එය නාට්‍යයේ උච්චතම අවස්ථාව ලෙස සැලකේ.

**ඇගයීම :**

ඔබ දන්නා ජනකතාවක් ඇසුරින් නාට්‍යයකට සුදුසු ගැටුම් අවස්ථා කිහිපයක් ලියන්න.

# වේෂභූෂණ හා නාට්‍යෝපකරණ නිර්මාණය කිරීම

1. **නාට්‍යෝපකරණ යනු**

නාට්‍යෝපකරණ යන්නෙන් අදහස් කරන්නේ නාට්‍යයේ කතා තේමා විසින් ඉල්ලා සිටින සහ කතා තේමාව තුල ඇති අර්ථය වඩා මතුකර දැක්වීමට සමත්, විශේෂයෙන් ම නාට්‍යයේ දී අත්‍යවශ්‍යයෙන් ම භාවිතාවන උපකරණයන් ය. එය නාට්‍යයේ අර්ථ ප්‍රකාශනය සඳහා ඉතා වැදගත් කාර්යයක් ඉටු කරයි.

උදා :.

- ⋆ මනමේ නාට්‍යය ගත්විට මනමේ කුමරු සහ වැදිරජුගේ කඩුව, පළිහ, දුනු ඊතල, වැද්දන් අතෙහි ඇති හෙල්ල
- ⋆ දික්තල කාල ගෝල නාට්‍යයේ ගත් විට කාලගෝල විසින් ගෙනයන කැවුම් පොදිය

2. **රංගනයකට අවශ්‍ය නාට්‍ය උපකරණ සැලසුම් කිරීම**

කිසියම් නාට්‍යානුශාරී අවස්ථාවක් සඳහා නාට්‍යෝපකරණ නිර්මාණය කර ගැනීමේ දී නාට්‍ය පිටපත විසින් අනිවාර්‍යයෙන් ම ඉල්ලා සිටින උපකරණ පිළිබඳ ප්‍රමුඛත්වයක් ලබා දිය යුතුය.

උදාහරණ ලෙස "මනමේ නාට්‍යය" ගත් විට, මනමේ කුමරාගේ කඩුව, දුනු ඊතල, පළිහ ආදිය ද, වැදිරජුගේ කඩුව, දුනු ඊතල, වැද්දන්ගේ හෙල්ල, පළිහ ආදිය ද ගත හැකිය.

තව ද, "සුභ සහ යස" නාට්‍ය ගත් විට රාජ ආසනය, මධු බඳුන, ආරක්ෂකයන්ගේ හෙල්ල ආදිය ගත හැකි ය.

එසේ ම "කාවෝ කැවෝ" නාට්‍යය ගත් විට පොත් පත්, කොස්ස ආදිය ගත හැකිය.

රංගෝපකරණ සැලසුම් කිරීමේ දී රංගෝපකරණය වචනයකින් හෝ භාවිත වීම අත්‍යවශ්‍ය කරුණකි. අනවශ්‍යය භාණ්ඩ වේදිකාව මත තැබීමෙන් නාට්‍යයේ අර්ථයට හානි සිදුවිය හැකි ය.

නාට්‍යෝපකරණ සහ පසුතල නිර්මාණ සමීප සම්බන්ධතාවයක් ඇති බව මතක තබා ගත යුතුය. නමුත් නාට්‍යෝපකරණ සහ පසුතල නිර්මාණ යන්න එකම නොවන බව ද මතක තබා ගැනීම වැදගත් ය. සාමාන්‍ය උපකරණයක් මගින් සිදුවීමක අදහස තිව්‍ර කරන අතර පසුතල නිර්මාණයෙන් බොහෝ විට සිදුවන්නේ ස්ථානය පිළිබඳව අදහසක් ඇති කිරීමයි.

නාට්‍ය උපකරණ සැකසීමේ දී නාට්‍යය ආකෘතිය (ලෝකධර්මී/නාට්‍යධර්මී නොවන) සහ කතාව අයත් වන කාලවකවානුව, සමාජීය ලක්ෂණ හඳුනා ගෙන එයට ගැළපෙන පරිදි සකසා ගත යුතුය.

උදා :.

කඩුවක් ගත්විට ලෝකධර්මී නාට්‍යයකට අවශ්‍ය නම් සාමාන්‍ය කඩුවක් ලෙසත් නාට්‍යධර්මී නාට්‍යයකට අවශ්‍ය නම් එයට අවශ්‍ය පරිදි අතිශෝක්තිය දනවන පරිදි රටා, කැටයම් සහ හැඩතල යොදා ගනිමිනුත් නිර්මාණය කර ගත හැකිය.

එසේ ම,

කාලවකවානුව හෝ සමාජීය ලක්ෂණ හඳුනා ගැනීමේ දී රාජාසනයක් ගත්විට ඉන්දියාවේ ධර්මාශෝක රජුගේ රාජ ආසනය නම් ඔහුට එම යුගයට සහ දේශයට අයත් සිංහ කුළුණෙහි කැටයම්, රාජාසනයේ කකුල් වලට සහ යම් යම් තැන්වලට යොදා සකසා ගත හැකිය.

3. <u>නාට්‍යෝපකරණ නිර්මාණය කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු</u>

* සැහැල්ලු හා සරල විය යුතුයි.
* නාට්‍යය පිටපතෙහි ඇති අවශ්‍යතා සපුරා ගත යුතුයි.
* පහසුවෙන් පරිහරණය කල හැකි විය යුතුයි.
* පිරිවැය අවම කර ගත යුතුයි.
* පහසුවෙන් ප්‍රවාහනය කිරීමට හැකි විය යුතුයි.
* උපකරණ භාවිතයේ දී චරිත නිරූපණයට බාධාවක් ඇති නොවිය යුතුයි.

උද ::
- උපකරණයේ කොටස් ගැලවී යාම
- උපකරණය කැඩී යාම
- ක්ෂණිකව ගැනීමට අවශ්‍ය වූ විට ගැනීමට අපහසු වීම වැනි දේ සිදු නොවිය යුතුය.

4. <u>වේෂභූෂණ යනු,</u>

"වේෂභූෂණ" යන්න ගත්විට "වේෂ" යනුනෙන් ඇඳුම් පැළඳුම් අර්ථවත් වන අතර "භූෂණ" යන්නෙන් ආභරණ යන්න අර්ථවත් වේ. එසේ සලකන විට "වේෂභූෂණ" යනු රංග වස්ත්‍රාභරණ යි.

රංග වස්ත්‍රාභරණ චරිතය හඳුනා ගැනීම ප්‍රේක්ෂකයාට පහසු කරයි. චරිතයට අදාල ඇඳුම් සහ පළඳින දේ වේෂභූෂණ යටතට අයත් වේ.

උදා ::
★ රජ චරිතයක් ගත් විට එයට අදාළ රාජසළුපිළි සහ රාජාභරණ
★ පොලිස් නිළධාරියෙකුගේ චරිතයක් ගත් විට ඔහුට අදාළ නිල ඇඳුම, සංකේත පටි, ඉනපටිය, පොලිස් හිස්වැසුම, සපත්තු ආදිය.

වේෂභූෂණ මගින් චරිතයේ බාහිර ස්වරූපය පිළිබඳව යම් අදහසක් ප්‍රේක්ෂකයා වෙත ගෙනයාම සිදුවේ.

5. <u>රංගනයට අවශ්‍ය වේෂභූෂණ සැලසුම් කිරීම</u>

නාට්‍යයකට වේෂභූෂණ සැකසීමේදී පෙර පරිදිම නාට්‍ය පිටපතෙහි ඇති නාට්‍යය ආකෘතිය ලෝකධර්මී ද නාට්‍යය ධර්මී ද යන්න හඳුනා ගත යුතුය.

උදාහරණ ::. මනමේ නාට්‍යයේ වැදි රජගේ චරිතය, මනමේ කුමරුගේ චරිතය, කුමරියගේ චරිතය නිර්මාණය කිරීමේදී ඔවුන්ගේ ඇඳුම් පැළඳුම් නාට්‍යය ධර්මී ලක්ෂණ මතුවන පරිදි සකසා ගත යුතුය.



විකෘති නාට්‍යයේ එන පියාගේ චරිතය, දුවගේ චරිතය, ගුරුවරයාගේ චරිතය නිර්මාණය කිරීමේදී ලෝකධර්මී ලෙස සකසා ගත යුතුය.



තවද වේෂභූෂණ සකසා ගැනීමේදී චරිතයට අදාළ ලක්‍ෂණ පිළිබඳව හොඳ අවබෝධයක් තිබිය යුතුය. චරිතයේ ස්වභාවය, යුගය, ප්‍රදේශය ආදී කරුණු සලකා බැලිය යුතුය. අනවශ්‍යය ලෙස ආභරණ හෝ වස්ත්‍ර යොදා ගැනීමෙන් රංගන ශිල්පියාගේ රංගනයට බාධා මතුවීම වැනි නාට්‍යයේ අර්ථයට හානි පමුණුවන දේ සිදුවිය හැකිය.

උදා :-. රජතුමාගේ චරිතයට රංග වස්ත්‍රාභරණ

* වඩාත් දිලිසෙන හෝ සංකීර්ණ රටා සහිත ඒවාට වඩා සරල සැහැල්ලු යෙදුම් කිහිපයකින් චරිතය මතුකර ගැනීම සාර්ථක ය.

* ඇඳුමෙහි යට කොටස ලෙස සාරියක් ජෝතියක් ආකාරයෙන් සකසා ගත හැකිය.

* රජුගේ දකුණු උරහිසේ සිට වම් ඉණ ප්‍රදේශය හරහා යන පරිදි ඉතා අඩු දිස්නයක් ඇති සල්වාරි ඇඳුමක සෝල් එකක් භාවිතා කළ හැකිය.

* අත්පළඳනා සහ ඉණ පළඳනා කාඩ්බෝඩ් මගින් නිර්මාණය කරගෙන දිලිසෙන රටා හා හැඩතල සහිතව වර්ණ ගන්වා ගත හැකිය.

* ඔටුන්න හිසෙහි හැඩයට සමාන හිසෙහි රැඳවිය හැකි ප්‍රමාණයේ ප්ලාස්ටික් රවුම් භාජනයක් ගෙන එයට ගම් සහ ජලය ආධාරයෙන් කඩදාසි පල්ප් වලින් සකසා ගෙන දිලිසෙන වර්ණවලින් වර්ණ ගන්වා සකසා ගත හැකිය.



* කඩුව ලීපටියක් ගෙන තවත් කුඩා ලී පටියක මිට ප්‍රදේශය වෙන්කර පෙනෙන පරිදි ඇණයකින් හෝ කම්බියක් මගින් රඳවාගෙන ලී පටියේ අවසාන කෙලවර තුඩක් ඇතිවන සේ උල්කර ගෙන වර්ණ ගන්වා භාවිත කල හැකිය.

* මිරිවැඩි සඟල අප භාවිත කරන සාමාන්‍ය සෙරෙප්පු කුට්ටමක් ගෙන එහි ඇඟිලි පිහිටන ප්‍රදේශය කාඩ්බෝඩ් එකක් මගින් වැසෙන පරිදි උල් හැඩයක් ඇතිව සකසා ගෙන වර්ණ ගැන්වීම මගින් සකසා ගත හැකිය.

* මේ සියළු නිර්මාණවලදී රජකෙනෙකුගේ චරිතයක් තුල ගාම්භීර, ශාන්ත හා උසස් යන ලක්‍ෂණ ඇති නිසා දම්වර්ණ, කහවර්ණය, තැඹිලි වර්ණ, සුදු වර්ණ සහ රන්වන් පැහැය යන වර්ණ භාවිත කිරීම යෝග්‍ය වේ.

6. <u>වේෂභූෂණ සැකසීමේදී සැලකිලිමත් විය යුතු කරුණු</u>

- නාට්‍යයේ ආකෘතිය හඳුනාගත යුතුයි.
- නළු කාර්යයට බාධාවක් නොවිය යුතුයි
- නාට්‍යයේ පිටපතට අනුකූල විය යුතුයි.
- ආලෝකකරණය සමඟ ප්‍රේක්‍ෂකයාට බාධාවක් ඇති නොවිය යුතුය.
- පහසුවෙන් පැළඳීම හා ගලවා දැමීමට හැකි විය යුතුයි
- රංග කාර්‍යයට බාධාවක් ඇති නොකළ යුතුයි
- අවම වියදමකින් නිර්මාණය කර ගත යුතුය
- ප්‍රවාහනයට පහසු විය යුතුයි
- රංගන ශිල්පියාගේ සමේ වර්ණය, පසුතල නිර්මාණවල වර්ණයන් රංග භාණ්ඩවල වර්ණයන්, අලෝක වර්ණය ආදිය පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

# නාට්‍යෝපකරණ සැලසුම් කිරීම හා නිර්මාණය

නාට්‍යයක දී වේදිකාව මත භාවිතයට ගැනෙන විවිධ භාණ්ඩ සහ උපකරණ නාට්‍යෝපකරණ ලෙස හැඳින්විය හැකියි. තවත් ආකාරයකින් කියනවානම් නාට්‍යයක චරිත විසින් වේදිකාවේ දී භාවිත කරන විවිධ උපකරණ නාට්‍යෝපකරණ නම් වේ. නාට්‍යෝපකරණ යොදාගත යුත්තේ අත්‍යාවශ්‍ය නම් පමණි. දර්ශනයට අදාල පසුබිමට අනුව එම අවස්ථාවේ දී නළු නිළියන් විසින් පරිහරණය කරන උපකරණ පමණක් මේ සඳහා යොදාගත යුතුය. ඔබට ඉහතින් දක්නට ලැබුණේ එවැනි උපකරණ කීපයකි. මීට අමතරව හත ශ්‍රේණියේ දී ඔබ විසින් රංග භාණ්ඩ නිර්මාණය කරගත් ආකාරයද නැවත සිහිපත් කරගන්න.

ඒ සඳහා අපි යොදාගත් අමුද්‍රව්‍ය මතකයෙන් ලැයිස්තුගත කරමු.

- කාඩ්බෝඩ්
- ගම්
- කතුරක්
- ඉදිකටු සහ නූල්
- කෝඩ් නූල්
- හලාගත් වැලි
- ඉවත දැමූ ප්ලාස්ටික් භාජන
- මෙගා බෝතල්
- කම්බි

ආදී විවිධ දේවල් යොදාගෙන කුමන හෝ රංග භාණ්ඩයක් සකස් කළ බව ඔබට මතක් වෙනවා ඇති. මතක නැතිනම් අපි ඒ වගේ එකක් නැවත හදමු. අපි හදාගන්න යන්නේ පොරවක්. මේ සඳහා අවශ්‍ය වෙනවා,

- කාඩ්බෝඩ් කැබැල්ලක්
- රෙදි වෙළඳසල් වලින් ඉවත් කරන කඩදාසි බටයක් හෝ පී වී සී බටයක්

- පළමුව කාඩ්බෝඩ් කැබැල්ලෙන් පහත සඳහන් හැඩ කපා ගන්න. පළමු රූප සටහනේ 1, 2, 3 රූප බලන්න.






- ඉන් පසු දෙවන රූප සටහනේ ආකාරයට 3 කාඩ්බෝඩ් කැබැල්ල කඩදාසි බටය වටේ අලවාගන්න.








- ඉන්පසු අංක 1 සහ 2 කැබලි දෙක රූප සටහනේ ආකාරයට අලවා ගන්න.
- අවසානයේ දී පොරෝ තලය කලු පාටින් සහ රිදී පාටින් පාට කර ගන්න.






- ඒ තමයි ඔබ හත ශ්‍රේණියෙදි හදාගත් එක් රංග භාණ්ඩයක්.

අද අපි හදාගන්න යන්නෙ සිංහාසනයක්. ඒ සඳහා පාසලේ තිබෙන ගුරු පුටුවක් යොදාගත හැකියි. කාඩ්බෝඩ් කැබලි කීපයක් යොදාගෙන ගුරු පුටුවෙ හැඩය වෙනස් කරල සිංහාසනයක් හදාගන්න ආකාරය පහත රූප සටහන්වල සහ විස්තරයෙ සඳහන් වෙනවා.



- මෙහි ඒ රූපයෙන් දක්වා ඇති පරිදි විද්‍යාලයේ සාමාන්‍යයන් භාවිත වන ගුරු පුටුවක් සිංහාසනයක් ලෙස වෙනස් කර භාවිත කළ හැකියි.
- කළ යුතු වන්නේ බී රූපයේ දැක්වෙන ආකාරයට පසුපස කොටසත් සී රූපයේ දක්නට ලැබෙන පරිදි ඉදිරිපස කොටසත් හාඩ්බෝඩ් හෝ වැනිස්ට්‍රා බෝඩ් මගින් හැඩ කපා වර්ණ කර ගැනීමයි.
- තව දුරටත් සිංහාසනයේ සුව පහසු බව නිරූපණය කළ යුතු නම් ඩී රූපයේ පරිදි පුලුන් හෝ එවැනි සැහැල්ලු ද්‍රව්‍ය පිරවූ කොට්ට යොදාගන්න පුලුවන්.
- මීට අමතරව නාට්‍ය වලදී බහුකාර්ය භාවිතයට ගන්නා ලී පෙට්ටි භාවිතයෙන්ද සිංහාසනය නිර්මාණය කරගන්න පුලුවන්. විකෘති නාට්‍යයේදී ඔබ දකින්න ඇති ඒ වගේ ලී පෙට්ටි භාවිත කරන ආකාරය.
- ඊ රූපයේ පරිදි ශක්තිමත් දැවයෙන් තැනූ අඩි එක හමාර එකහමාර ප්‍රමාණයේ පෙට්ටි කීපයක් යොදාගෙන ඒවාට විවිධ හැඩතල එකතු කර සිංහාසනය නිර්මාණය කරගත හැකියි.

ඉහත අපි සකස් කළ රංග භාණ්ඩ සඳහා විවිධ අමුද්‍රව්‍ය අවශ්‍ය වූ බව දැන් ඔබ දන්නවා. ඔබ වඩාත් නිර්මාණශීලීනම් ඉහත ක්‍රම වලට වඩා වෙනස් ආකාර වලින් ද රංග භාණ්ඩ නිරිමාණය කරගත හැකියි. දැනටමත් ඔබට එවැනි අදහස් ඇතිවෙලා තිබෙන්න පුළුවන්. හොඳම දේ ඔබට සිතුන ආකාරය කර බැලීමයි.නමුත් සෑම විටම සිහි තබා ගතයුතු කාරණය තමයි අපි සකස් කරන භාණ්ඩ වේදිකාවක් මත භාවිත කරන බව. එහි දී නළු නිළියන්ට අනතුරක් නොවන ආකාරයට වගේම රංගනයට බාධාවක් ඇති නොවන ආකාරයට නාට්‍යෝපකරණ සකස් කළ යුතුයි.

චරිතයට නිවැරදිව ගැලපෙන නාට්‍යයට උචිත නාට්‍යෝපකරණ යොදා ගැණීමෙන් නළුවාගේ රංගනය පහසු වෙනවා. ඒ වගේම ප්‍රේක්ෂකයාට නාට්‍යයේ රසය හොඳින් විඳගන්න හැකි වෙනවා.

**ඇගයීම්:**

1. නාට්‍ය උපකරණ සහ සාමාන්‍ය උපකරණ අතර වෙනසක් තිබේද?
2. ඒ වෙනස්කම් මොනවාද?
3. නාට්‍යයක් සඳහා උපකරණ නිර්මාණය කර ගැනීමේ දී සැලකිය යුතු කරුණු මොනවාද?
4. නාට්‍යයකදී උපකරණ භාවිත කිරීම භාවිත නොකිරීමට වඩා සුදුසු වන්නේ ඇයි?

# <u>අංගරචනය කිරීම</u>

## අංගරචනය

- චරිතයට උචිත ආකාරයට මුහුණ හා ශරීරයේ අංග ප්‍රත්‍යාංග නිර්මාණාත්මකව රචනා කිරීම මෙහි දී සිදු කෙරේ .
- නළුවා යටපත් කර චරිතය ඉස්මතු වනුයේ අංග රචනය නිසාය.
- අංග රචනය සරල අංග රචනය හා චරිතාංග අංග රචනය යනුවෙන් කොටස් දෙකකි.
- නාට්‍යයේ ශෛලිය අනුව අංග රචනය වෙනස් වේ.
- චරිතයක බාහිර සමාරෝපණයට අංග රචනය අවශ්‍ය වේ.





## <u>අංග රචනයේ ඇති වැදගත්කම</u>

- මුහුණේ ත්‍රිමාණ බව මතු කිරීමට.
- ප්‍රේෂකක්යන්ට නළුවාගේ මුහුණ පැහැදිලිව පෙනීමට.
- චරිත නිරූපණයේ සාර්ථකත්වයට.
- චරිතයකයට පිවිසීමට සහයක් ලැබීමට.
- ප්‍රේෂකක්යන්ට චරිතය මැනවින් අවබෝධ කරගැනීමට.









# <u>අංගරචනා සඳහා භාවිතා කරන ද්‍රව්‍ය හා උපකරණ</u>

Base make up (බේස් මේක් අප්)

- පදනම් ආලේපන වේමෙය ආලේපනය . මගින් මුහුණ සම මට්ටමකට ගෙන ඒමට භාවිතා කරයි.
  - Grease paint (ග්‍රීස් පේන්ට්)
  - Pan cake (පෑන් කේක්)





Lining colours (ලයිනින් කලර්ස්)

- මේවා විවිධ වර්ණ ලෙස භාවිතා කළ හැකවර්ණ මතු කිරීම ,රූප ,අංග රචනයේදී විවිධ හැඩ . .සඳහා භාවිතා කරයි























<u>**අංග රචනා ශිල්පියා සැලකිලිමත් විය යුතු කරුණු**</u>

- චරිත ස්වභාවය
- නාට්‍යයේ තේමාවආකෘතිය හා ශෛලිය ,
- ප්‍රේක්ෂකාගාරයේ ප්‍රමාණය
- රංගාලෝකය පිළිබඳව
- වෙස් මෝස්තර පිළිබඳව
- වේදිකාව පිළිබඳව
- නලුවාගේ සමේ වර්ණය පිළිබඳව
- මුහුණේ හැඩතල පිළිබඳව








ඇගයීම:

01. අංග රචනය හඳුන්වන්න.
02. අංග රචනා ද්‍රව්‍යය හා උපකරණ නම් කරන්න.
03. චරිතාංග අංග රචනය හා සරල අංග රචනය පැහැදිලි කරන්න.

# වේදිකා පසුතල සැලසුම්කරණය හා නිර්මාණය කිරීම.





වේදිකා පසුතල නිර්මාණය කියන්නේ ආනුශංගික කලාවක්. මෙය අයිති වෙන්නේ ආහාර්ය අභිනයටයි.

ලෝක ධර්මී නාට්‍ය වල පසුතල නිර්මාණ බහුලව දකින්න පුළුවන්.

වේදිකා පසුතල නිර්මාණය කර කරගැනීමේදී සැලකිය යුතු විශේෂ කරුණු කිහිපයක් තියෙනවා.

- නාට්‍යයෙන් ඉදිරිපත් කරන අවස්ථාවට ගැළපිය යුතුයි
- නිර්මාණාත්මක විය යුතුයි
- නාට්‍යෝචිත විය යුතුයි
- අලංකාර විය යුතුයි
- සරල විය යුතුයි
- පසුතලය නිසා නළුවා යටපත් නොවී නළු කාර්යය ඉස්මතු විය යුතුයි
- රඟපෑමට බාධාවක් ඇති නොවන පරිදි පසුතල නිර්මාණ සැලසුම් කළ යුතුයි
- රූපණ රටාවට ගැලපිය යුතුයි.
- නාට්‍ය පෙළ මගින් ඉදිරිපත් කෙරෙන කාලයට දේශයට යුගයට ගැලපිය යුතුය

(කාලය කියන්නේ නාට්‍යයේ කතා පුවත සිදුවුණා යැයි සැලකෙන කාල වකවානුවයි. දේශය කියන්නේ එම සිදුවීමට අදාළ රට හෝ ප්‍රදේශයයි. යුගය කියන්නේ මානව පරිණාමයේ එක් එක් විශේෂ ලක්ෂණ දක්නට ලැබෙන කාල වලටයි. එක් එක් යුගවල භාවිත කළ භාණ්ඩ ඇඳුම් පැළඳුම් වගේ සංස්කෘතික ලක්ෂණ යුගයට අනුව වෙනස් වෙනවා.)

- රංග ශෛලිය ට ගැලපෙන පරිදි පසුතල නිර්මාණ සැලසුම් කළ යුතුයි. (බොහෝවිට නාට්‍යධර්මී ශෛලියේ දී භාවිත වෙන්නේ අවම පසුතල නිර්මාණ ප්‍රමාණයක්. ඇතැම් විට පසුතල නිර්මාණ භාවිත වෙන්නේම නෑ )
- වර්තමානය වන විට පසුතල නිර්මාණ සඳහා චිත්‍ර වස්ත්‍ර සහ ප්‍රක්ෂේපණ යන්ත්‍ර (projector) භාවිත කරනවා. ප්‍රක්ශේපන යන්ත්‍ර මගින් පසු තිරය හෙවත් ගගනිකාව මත නාට්‍ය දර්ශනයට අදාළ පසුතලය මවා පෙන්වනවා.

දැන් ඔබටත් පුළුවන් ඔබ දන්නා ජනකතාවක් නාට්‍යයක් බවට පත් කරනව කියල හිතාගෙන එහි එක් අවස්ථාවකට හෝ සමස්ත නාට්‍යයට ම ගැළපෙන පසුතල දර්ශනයක් සරලව සකස් කරගන්න. ඔබ දෙවැනි වාරයේදී පෙළ රචනා කරන හැටි ඉගෙනගන්න ඇති. ඒ නිර්මාණය කළ පෙළට ගැලපෙන පසුතලයක් පළමුව කඩදාසියක සටහන් කර ගන්න. ඉන්පසු සරල ආකෘතියක් ලෙස ඔබේ පාඩම් මේසය මත ඉතා කුඩා ප්‍රමාණයේ වේදිකා පසුතලයක් කාඩ්බෝඩ් වලින් සකස් කරන්න පුළුවන්. එහිදී හොඳින් මතක තබා ගත යුතු දෙයක් තියෙනවා. ඒ තමයි වේදිකාව මත නළු නිළියන්ට රඟපෑම සඳහා ඉඩකඩ තිබිය යුතු බව. ඒ නිසා පළමුව මේසය මත වේදිකාවේ හැඩයට කොටුවක් ඇඳගෙන ඔබේ පිටපතට ගැලපෙන පසුතලයක් සකස් කර බලන්න.

**පසුතල නිර්මාණයකට යොදා ගත හැකි ද්‍රව්‍ය**

- කාඩ්බෝඩ්
- හාර්ඩ්බෝඩ්
- රීප්ප
- රිජිෆෝම්
- ගෝනි
- විවිධ රෙදි වර්ග ඔතා එවන කඩදාසි බට (කුළුණු ඉදිකිරීම සඳහා )
- තීන්ත සහ පින්සල්

ඇගයීම:

1. පසුතල නිර්මාණ යනු මොනවාද?
2. පසුතල නිර්මාණ සැලසුම් කිරීමේදී සැලකිය යුතු කරුණු මොනවාද?
3. ඔබ දන්නා ජනකතාවක එක් අවස්ථාවකට ගැලපෙන පසුතල නිර්මාණයක් ඇඳ දක්වන්න.

# <u>ආනුශංගික කලා</u>

- ආනුශංගික කලා ලෙස හඳුන්වන්නේ නාට්‍යයක් රඟපාන විට දී වේදිකාවට පිටතින් රැගෙන එන වෙනත් කලා අංගයන්ය. එසේත් නැත්නම් නාට්‍යය නිෂ්පාදන ක්‍රියාවලියේ දී නාට්‍යයෙේ රසය උදෙසා නාට්‍යයට බාහිරින් එකතු කරනු ලබන කලාවන්ය.
- මෙම ආනුශංගික කලාවන් සතර අභිනයන්ගෙන් ආහාර්ය අභිනයට අයත් වේ.
- ආනුශංගික කලාවන් රංගනය හා එකතු වී නාට්‍යයේ අර්ථය.ගුණය තීව්‍ර කරයි ,රසය ,




## <u>ආනුශංගික කලාවන්ගේ කාර්ය භාර්ය,</u>






❖ පසුතල නිර්මාණ

නාට්‍යෝචිත පරිසරය වේදිකාව මත ප්‍රතිනිර්මාණය කිරීම සඳහා ඊට උචිත පරිදි වේදිකාවේ භූගෝලීය පරිසරය සකස් කිරීම පසුතල නිර්මාණය වේ.





❖ සංගීතය

නාට්‍යෝචිත අවස්ථාව, ඒ හා බැඳුණු හැඟීම් වඩාත් තීව්‍ර කිරීම සඳහා ගීත හා සංගීත නාද මාලා යොද ගනියි.

❖ රංග භාණ්ඩ

චරිත නිරූපණයට උචිත පරිදි නාට්‍යෝචිත අවස්ථාව අනුකරණය කිරීම සඳහා භාවිතා කරනු ලබන භාණ්ඩ රංග භාණ්ඩ වේ.





❖ අංග රචනය

බාහිර සමාරෝපය සඳහා වැදගත් වේ . චරිතයට උචිත ආකාරයට මුහුණ සහ ප්‍රත්‍යාංග , ශරීරයේ අංග .නිර්මාණාත්මකව රචනා කරයි

## ආනුශංගික කලා නිර්මාණය කිරීමේ දී සැළකිලිමත් විය යුතු කරුණු

- නාට්‍ය පෙළ හොඳින් අධ්‍යයනය කළ යුතුය .(පිටපතේ කියවෙන කාලය ,දේශය ,යුගය ,චරිත හා සමාජ තත්වයන්)
- අධ්‍යක්ෂකගේ අර්ථ කථනය පැහැදිලි කරගත යුතුය.
- නාට්‍ය නිර්මාණය කරන ශෛලිය පිළි (මිශ්‍ර ,ලෝක ධර්මී ,නාට්‍ය ධර්මී)බඳව අවධානය යොමු කළ යුතුය.
- ආනුශංගික අංග නිර්මාණය කිරීම සඳහා ඒ ඒ ක්ෂේත්‍රයන්ට අදාළ ශිල්පීන් සම්න්ධ කර ගන්නේ නම් වඩාත් සුදුසුය.
- සියලුම ආනුශංගික කලා එකිනෙක කලාවන් සමග සහසම්බන්ධ විය යුතුය.
- මනා අවබෝධයකින් ආනුශාංගික අංග භාවිතා කල යුතුය.
- වර්ණ භාවිතය පිළිබඳව අවධානය යොමු කළ යුතුය.
- නාට්‍යයට බාහිර අලංකරණයක් ලෙස හෝ අනවශ්‍ය ලෙස යොදා නොගත යුතුය.
- රංගනයට බාධාවක් නොවන අයුරින් ආනුශාංගික අංග නිර්මාණය කළ යුතුය.
- පිරිවැය හා කල් පැවැත්ම පිළිබඳව සිතා නිර්මාණය කළ යුතුය.
- ආනුශංගික කලා සමග සවේශ පුහුණුවක් කළ යුතුය.

ඇගයීම :

1. ආනුශංගික කලා යනු කුමක් ද ?
2˙ ආනුශංගික කලා මොනවා ද?
3˙ ආනුශංගික කලා නිර්මාණයේ දී සැළකිලිමත් විය යුතු කරුණු මොනවාද ?
4˙ ඔබ නරඹා ඇති වේදිකා නාට්‍යයක ආනුශංගික කලා භාවිතා කර තිබූ ආකාරය විස්තර කරන්න.

# රංග ක්‍රීඩා

රංග ක්‍රීඩා කියන්නේ රංග ශිල්පියෙකු තම කුශලතා වර්ධනය කර ගැනීම සඳහා නිරතවන ක්‍රීඩාවන් වලටයි. ඇතැම් ජන ක්‍රීඩා වර්ගත් රංග ක්‍රීඩා ලෙස යොදා ගන්නවා.

බොහෝ විට ඔබත් ඔබගේ විෂය භාර ගුරුතුමා විසින් විවිධ රංග ක්‍රීඩාවල යොදවා ඇති. හය හත පන්ති වලදීත් ඔබ එවැනි රංග ක්‍රීඩාවල යෙදෙන්නට ඇත.

**<u>රංග ක්‍රීඩාවල යෙදීම මගින් වර්ධනය කරගත හැකි කුශලතා</u>**

- ක්ෂණිකව ක්‍රියාත්මක වීම හා ක්ෂණිකව ක්‍රියාත්මක වීමේ හැකියාව වර්ධනය වේ.
- අවස්ථානුකූලව කටයුතු කිරීමේ හැකියා වර්ධනය වේ.
- කණ්ඩායම් හැඟීම සහ සාමූහිකව කටයුතු කිරීමේ කුශලතා වර්ධනය වේ.
- අවධානය දියුණු වේ.
- සබකෝලය දුරු වේ.

මෙම පාඩමේ දී අප අවධානය යොමු කරන්නේ තුන්වන වාරයේ දී ඔබට පන්ති කාමරය තුළ සිදු කිරීමට නියමිතව තිබූ රංග ක්‍රීඩාව පිළිබඳ පැහැදිලි කිරීමටයි.

පියවර

1. ඔබේ ගුරුතුමා විසින් ඔබ සියලු දෙනාම නිදහස් අවකාශයකට කැඳවාගෙන යනු ඇත.
2. පහත සඳහන් හැඟීම් සහිත පත්‍රිකා හතරෙන් එකක් ඔබට තත්පර කිහිපයක් පෙන්වනු ලබයි.

| 1 පත්‍රිකාව | 2 පත්‍රිකාව | 3 පත්‍රිකාව | 4 පත්‍රිකාව |
|---|---|---|---|
| A - දුක | A - පිළිකුල | A - සතුට | A - කෝපය |
| B - සතුට | B - කෝපය | B - දුක | B - පිළිකුල |
| C - කෝපය | C - සතුට | C - පිළිකුල | C - දුක |
| D - පිළිකුල | D - දුක | D - කෝපය | D - සතුට |

3. දැන් එම පත්‍රිකාව සඟවා එහි සඳහන් අක්ෂර පිළිවෙලින් ගුරුවරයා ප්‍රකාශ කරන විට ඔබ ඊට අදාල හැඟීම මතකයෙන් ප්‍රකාශ කළ යුතුයි.
4. ඉන් පසු ගුරුවරයා අපිළිවෙලින් එම අක්ෂර ප්‍රකාශ කරන අතර ඔබ ඊට අදාල හැඟීම ප්‍රකාශ කළ යුතුයි.
5. ඉන්පසු ගුරුවරයා ඔබට පරිසරයේ නිදහසේ ඇවිදින්නට උපදෙස් දෙයි. ගුරුවරයා යම් සංඥාවක් කරන විට ඔබ නැවතිය යුතු අතර එවිට ගුරුවරයා ප්‍රකාශ කරන අක්ෂරයට අදාළ හැඟීම ඔබ **නිරූපණය** කළ යුතුයි. (මුහුණින් හැඟීම් ප්‍රකාශ කළ යුතුයි) ගුරුවරයා අපිළිවෙලින් මෙම අක්ෂර ප්‍රකාශ කරනු ඇත. ඔබ මතකයෙන් එම හැඟීම් නිරූපණය කළ යුතුයි.

6. ඉන්පසු ගුරුතුමා වෙනත් කාඩ්පතක් ඔබට හඳුන්වා දෙන අතර එහි හැඟීම් පළමු කාඩ්පතට වඩා වෙනස් ය. ඔබ එය මතකයෙන් නිරූපණය කළ යුතුය. වැරදි හැඟීම් නිරූපණය කරන සිසුන් තරගයෙන් ඉවත් කරන අතර ඔවුන් නිරීක්ෂකයින් ලෙස සහභාගි වනු ඇත.
7. මේ ආකාරයට කාඩ්පත් හතරම වරින්වර ඉදිරිපත් කරන අතර අවසානයේ දී එක් සිසුවෙකු ඉතිරි වන තෙක් තරගය පවත්වනු ඇත.ඉතිරිවන සිසුවා ජයග්‍රාහකයා ලෙස නම් කරනු ලබයි

මෙම රංග ක්‍රීඩාව තුලින් අවධානය, ස්මරණය හා රංගන හැකියාවන් දියුණු වේ. එමෙන්ම සබකෝලය දුරු වේ. මෙය ඔබට උද්යෝගිමත් අත්දැකීමක් වනු ඇත.

ඇගයීම:

1. රංග ක්‍රීඩා යනු මොනවාද?
2. රංග ක්‍රීඩාවලින් ඇති ප්‍රයෝජන නම් කරන්න.
3. පන්ති කාමරයේ දී ඔබ සිදු කළ රංග ක්‍රීඩාවක් පියවරෙන් පියවර විස්තර කරන්න.

## ➢ <u>මාෂා හා වළහා</u>






- ඩී .කුමාරගේ මහතාගේ නිර්මාණයකි.
- රුසියන් ජනකතාවක් ආශ්‍රිතව නිර්මාණය වූවකි.
- ළමා නාට්‍යයකි.
- සරල තේමාවක් යටෙත් නිර්මාණය කර ඇත.
- ළමා මනසට ගැළපෙන ළමා ලෝකය නියෝජනය කරන කථාවකි.

### <u>මාෂා හා වළහා  කථාව කෙටියෙන්,</u>






මාෂා කියලා පුංචි දැරියක් හිටියා. එයා ජීවත් වුණේ ආච්චිත් එක්ක. දවසක් මාෂා යාලුවෝ එක්ක කැලේට ඇවිත් සමනල්ලු අල්ලන්න ගිහින් කැලේ අතරමං වෙනවා. කැලේදි එයා බියට පත් වෙලා උදව්වට කෙනක් සොයා ගෙන යද්දී කැලේ තිබුණ ගෙයක් දැකල එතනට යනවා.
ඒ ගෙදර වළස් රාළගේ. මේ ගේ හරිම ලස්සනයි. පිළිවෙලයි. මාෂාට බඩගින්නක් ආවා. එයා එතන තිබුණ ටික වෙලාවකින් වළහ සී පදයක් කියාගෙන ගෙදරට එනවා. මාෂා බයවෙලා හැංගුනත් වළහට කකුල පෑගිලා කෑ ගහනවා.
දෙන්නාම බය වෙනවා. මුලින්ම මාෂා කියන්නේ මන්තර කාරියක් කියලා වළහා හිතුවත් පස්සේ මාෂා කියන්නේ පොඩි ළමයෙක් කියලා දැනෙගන ගෙදර වැඩ ටික කරගන්න මාෂාව සිර කරලා තියගන්නවා.

දවසක් වළහා මී වද කඩන්න ගිය වෙලාවක මී මැස්සෝ එනවා වළහගේ ගෙදරට. වළහා එයාලගේ මී වද කඩලා මී මැසි ජනපද විනාශ කරන නිසා වළහට පාඩමක් උගන්වන්නයි එයාලා වළහගේ ගෙදරට එන්නේ. එතනදී මී මැස්සන්ට මාෂා හමු වෙනවා. මාෂා එයාට වුණ කරදරය මී



මැස්සන්ට කියලා උදව් ඉල්ලුවා. ඒත් මාෂා අහිංසක සත්තුන්ට කරදර කරපු ළමයෙක් කියලා දැන ගත්තම මී මැස්සෝ එයාට උදව් කරන්න බෑ කියනවා.
මාෂා පොරොන්දු වෙනවා ආයේ කිසිම සතෙකුට කරදර කරන්නේ නෑ කියලා. ඊට පස්සේ මී මැස්සෝ වළහට පාඩමක් උගන්නන්නම් කියලා මාෂාට ගෙදර යන්නට උදව් කරන්න තීරණය කරනවා.
එයාලා මාෂාට උපක්‍රමයක් කියලා දෙනවා. වළහා ගෙදර ආවම මාෂා වළහට කියනවා ආච්චි මී වද කන්න ආසයි. එයාට මී වද ටිකක් ගිහින් දෙන්න කියලා. ඊට පස්සේ මී වදේ පෙට්ටියකට දාලා වළහට දීලා මාෂා කියනවා අතරමගදී පෙට්ටිය අරින්න එපා කියලා.
එහෙම කියලා මාෂා පෙට්ටිය ඇතුළට හොරෙන් රිංගනවා. වළහා ආච්චිගේ ගෙදර යන අතරමගදී බඩගිනි වෙලා කීප සැරයක් මී වදය කන්න හැදුවත් පෙට්ටිය ඇතුළේ හොරෙන් හිටපු මාෂා මතක් කළා පෙට්ටිය අරින්න එපා කියලා. ඒක නොදන්න වළහා පුදුම වුණා ගෙදර ඉන්න මේ කෙල්ලට මෙච්චර දුර පේන්නේ කොහොමද කියලා.
අන්තිමේදී වළහා ආච්චිගේ ගෙදරට ආවා. වළහා දැකපු ආච්චී බය වෙලා කෑ ගැහුවා. වළහත් බය වුණා. අවසානයේ මාෂා ආච්චිට මීවද දෙන්න කීවායි කියා කරතියාගෙන ආ මීවද පෙට්ටිය වළහා ආච්චිට දුන්නා.
මී වද පෙට්ටිය ඇරලා බලනකොට මාෂා ඇතුළේ. මාෂාව දැකපු වළහාට තරහා ගිහින් මාෂාව අල්ලගන්න හදනවා.
අවසානයේ ආච්චිගේ උදව්වෙන් මාෂා වළහගෙන් බේරිලා වළහට ගෙදර තිබුණ කැවුම් පෙට්ටියක් තෑගි කරනවා.

වළහා කැවුම් පෙට්ටියත් අරන් මාෂාට ස්තුති කරලා සතුටින් පිටව යනවා. මාෂා ආච්චිට පොරොන්දු වෙනවා ආයේ කීකරුව ඉන්නවා කියලා.



# <u>මෙම නාට්‍ය නිර්මාණය කිරීම සඳහා පාදක වූ රුසියානු ජන කතාව මෙසේය.</u>



එක් ගම්ක මහලු සීයා කෙනෙක් සහ ආච්චි කෙනෙක් සමග දියණියක් වාසය කළේය. මේ දියණිය නමින් මාෂා විය. දිනක් ඇය තමයි යහළුවන් සමඟ කැලයට ගොස් බිම් මල් සහ පලතළතුරු කැඩීමට යාමට අවසරය පැතිය, එවිට ආච්චි මශා හට යහළුවන් දමා කැලයේ දුරට ගමන් නොකර ලෙස අවවාද කරමින් ඇයට යාමට අවසර දුනි.



මාෂා යහළුවන් සමඟ බිම්මල් කඩමින්, පලතුරු කඩමින් කෙමෙන් කෙමෙන් ඉදිරියට ම යහළුවන්ගෙන් දුරකට ගමන් කළේය.මාෂා කෑ ගසමින් යහළුවන්ට කතා කරත්, එහෙත් කිසිම කෙනෙකුට මාෂාගේ හඬ නොඇසුණි. ඇය වනාන්තරය පුරාම ඇවිදින්නට විය.එක වරම ඇයට කුඩා නිවසක් දක්නට ලැබුණි. ඇය එම නිවස ඇතුළට ගොස් පුටුවක වාඩිවී කල්පනා කරන්නට විය. මේ නිවසේ කවුරු වාසය කරයිද යන බිය ඇයගේ සිත් තුළ විය.



අනතුරුව විශාල වලසෙක් පැමිණියේය.ඒ වලහා මාෂාට යළි යාමට නොදී, තම නිවසේ වැඩ කටයුතු කරන ලෙස පැවසීය. මේ අයුරින් කාලයක් පුරාවට මාෂා වලහගේ මෙහෙවර කරමින් කාලය ගත විය.

දිනක් ඇය වලහට තම ආච්චි හා සීයා හට කන්න මොකුත් ගිහින් දීමට අවශ්‍ය බව පැවසූ විටදී වලහා එයට අකමැති විය. ඊට පස්සේ වලහා විසින් ඒ කෑම බිම ගිහින් දීමට කැමති විය.



මේක අවස්තාවක් කර ගත් මාෂා බනිස් වගයක් හදලා එක විෂාල බාස්කට් එකක් ඇතුලට දමන ලදී. ඊට පස්සේ මාෂා වලහට මේකේ පියන නොඅරින ලෙසට කියා ඇය හොරෙන් අර විශාල බාස්කට් එකට ඇතුලට රිංගුවේය.

වළහා ආච්චිගේ ගෙදර යන අතරමගදී බඩගිනි වෙලා කීප සැරයක් මේ බනිස් කන්න හැදුවත් පෙට්ටිය ඇතුළේ හොරෙන් හිටපු මාෂා මතක් කළා පෙට්ටිය අරින්න එපා කියලා.



මහ පුදුම කෙල්ලෙක් යැයි, සිතමින් වලහා ගමන් කරන්නට පටන් ගත්තා.

කෙමෙන් කෙමෙන් ආච්චිගේ නිවසට ලගා උන වලහ දුටු බල්ලන් බුරන්නට විය. එයට බය වී වලහා බාස්කට් එක බිමට දමා දුවන්නට විය.



**මෙම රුසියානු ජන කතාවේ අන්තර්ගත ඇතැම් සිදුවීම් නාට්‍ය කරුවා විසින් භාවිතා කර නොමැත.එනම්,**

- මාෂා බිම් මල් කැඩීමට හා පලතුරු කැඩීමට මෙහිදී කැලයට ගොස් අතරමං වෙන අතර , දී සමනල්ලු අල්ලන්න නාට්‍යයේ ගිහින් කැලේ අතරමං වීම නිරූපණය කරයි.
- නාට්‍යයේදී මාෂා වලස් රාළගේ ගෙදරට ගොස් එහිදි මී වද දැකලා ඒක කනවාර්ට පස්සේ . .එයාට නිදිමතක් ඇවිත් එතන තිබුණ ඇදේ හොදට නිදා ගන්නවා
- නමුත් ජන කතාවේදී මාෂා වලහගේ ගෙදර පුටුවක් මතට වී කල්පනා කරයි.
- නාට්‍යයේදී මශාට බේරී යාමට මී මැස්සන් මගින් උදව් ලැබෙන අතර ජන කතාවේදී මාෂා තනිවම කල්පනා කර එම උපාය කියාත්මක කිරීම.
- කුඩය තුල සැඟවී පැමිණෙන මාශාව ජන කතාවේ දී වලහට හසු නොවේනමුත් නාට්‍ය තුල , එවිට ආච්චි පැමිණ බේරා .එය නාට්‍යෝචිත පරිදි යොදා ගනිමින් මාෂා වලස් රාළට හසු වේ .ගැනීම නාට්‍යෝචිතව පෙළ ගස්වා ඇත
- නාට්‍ය අවසානයේ වලස් රාළ මාශාගේ ආච්චි සමඟ හිතවත් වී සුහදව පිටව යන අතර ජන කතාවේ දී වලහා බිය වී කුඩය බිම දමා පිටව යයි.
- එසේම නාට්‍යකරුවා විසින් චරිත අතරට මී මැස්සන්ව එක් කිරීම .

මෙයින් අපට අවබෝධ වන්නේ කතාවක් තුල අන්තර්ගත වන සියලුම සිද්ධි නාට්‍ය සඳහා භාවිතා කිරීමෙන් එහි නාට්‍යමය ගුණයට බාධාවක් ඇති විය හැකි බවත්, ජන කතාවේ ඇතැම් සිදුවීම් අපේ පරිසරයට උචිත පරිදි දීමට නාට්‍ය කරුවා සමත වී ඇති බවත් ය.

## නාට්‍යයේ චරිත.



- මාෂා
- වළහා
- මී මැස්සෝ
- ආච්චි

## මාෂා හා වළහා  නාට්‍යයේ තේමාවන් කීපයකි.

සෑම නිර්මාණයක් තුළම තේමාවක් ඇත. නිර්මාණයක් ජනප්‍රිය වීමට තේමාව වැදගත් වේ. නාට්‍යයේ තේමාව යනු නාට්‍යයෙන් කියෙවන අදහසයි.

- උදව් කල අයට පෙරළා උදව් කිරීම.
- නපුරු ළමයින් නිරන්තරයෙන්ම ප්‍රතික්ෂේප වන බව.
- සෑම අයෙකු තුළම යහගුණ ඇති බව.
- නරක අය පවා යහපත් අයගේ ආශ්‍රය නිසා හොඳ විය හැකි බව.
- අවිහිංසාවේ ඇති වැදගත්කම.

## මාෂා හා වළහා නාට්‍යයේ අවස්ථා පෙළගැසී ඇති අයුරු.



- මාෂා කැලේ අතරමං වීම.
- වළහගේ නිවසට මාෂා පැමිණීම.
- වළහාගේ නිවසට  පැමිණි මාෂා මී වදය කෑම හා ඇඳේ නිදා ගැනීම.
- වළහා නිවසට පැමිණීම හා මාෂා වළහාට අසුවීම.
- වළහා මාෂා නිවසේ සිරකර තබා නිවසින් පිට වූ පසු මී මැස්සන්ගේ පැමිණීම.
- වළහා මාෂාගේ ආච්චි බැලීමට යාමට සූදානම් වීම.
- වළහා මාෂාගේ අච්චි බැලීමට යෑම.
- මග දී මී වදය කෑමට වළහා උත්සාහ කිරීම.
- ආච්චි හමුවීම හා මාෂා වළහගෙන් බේරීම.

- **චරිත ලක්ෂණ හා ගති ස්වභාවයන් කීපයක්.**

| චරිතය | බාහිර ලක්ෂණ | අභ්‍යන්තර ලක්ෂණ |
|---|---|---|
| මාෂා | • දඟකාර චරිතයකි.<br>• සතුන්ට හිංසා කරන චරිතයකි. | • උපක්‍රමශීලි චරිතයකි.<br>• විටෙක අකීකරු චරිතයකි.<br>• තවත් විටෙක කීකරු චරිතයකි.<br>• තම වැරදි නිවැරදි කර ගන්නා චරිතයකි. |
| වළහා | • නපුරු ස්වභාවයක් පෙනේ.<br>• බැලූ බැල්මට භයංකරයි.<br>• සතුන්ට හිංසා කරයි. | • මාෂා ළමා දැරිවියක් යයි සිතා කරදරයක් නොකරයි.<br>• දැරිවිය වැඩකාර කමට තබා ගෙන නිවෙස් තම වැඩ කරගැනීමට සිතයි. |
| ආච්චී | • අහිංසක වයස් ගත කාන්තාවකි. | • දරුවන්ට ආදරේ ඇති අයෙකි.<br>• කළගුණ සළකන කාන්තාවකි. |
| මී මැස්සෝ | • දඟකාරයි. | • මාෂාට හා වළහාට පාඩමක් උගන්නවන ලෙස සිතයි.<br>• මාෂාට ගෙදර යන්න උදව් කරයි. |

**<u>නාට්‍ය පෙළෙහි එන සංවාද වල ස්වභාවය</u>**

**උදාහරණ;**

මාෂා - මොනවද ඒ සැරේ වෙන්න යන්නේ....... කවුද ඒ පාර..... කවුද ඔයාලා.....

මී මැස්සෝ - අපි මේ මී මැස්සෝ.... මේ ගෙදර ඉන්න වළහා අපේ මී මැසි ජනපද විනාශ කරලා මී වද ටික ගත්තා. අපි ආවේ වළහට පාඩමක් උගන්වන්න.

මාෂා - වළහා තාම ආවේ නෑ..... වළහා ගෙදර නෑ........

මී මැස්සෝ - මේ වළහගේ ළමයෙක් වෙන්න ඇති. අපි මෙයාට පාඩමක් උගන්නමු.

මාෂා - මම වළහගේ ළමෙයක් නෙමෙයි. වළහා මාව මෙහෙ හිර කරගෙන ඉන්නේ. ගෙදර යන්න විදිහක් නෑ.

මී මැස්සෝ- හොඳයි අපි ඔයාට ගෙදර යන්න උදව් කරන්නම්. ඉස්සල්ලාම කියන්න ඔයා මෙහාට ආවේ කොහෙන්ද?

ඉහත සඳහන් ආකාරයට සරල වචන භාවිතා කරමින් දෙබස් ගොඩ නගා ඇත.

- **<u>නාට්‍යයේ එන ගීත කීපයක්</u>**



★ කැලේ හරිම ලස්සනයි
දිය ඇලි හෙමිහිට ගලයි
මල් පිපිලා සුවඳ දෙයි
ගෙඩි ඉදිලා සතුට දෙයි.

★ උතුරින් ගියොත් කොයිබටදෝ
හිම වලසුන් පිරි හිම කන්දයි
දකුණින් ගියොත් කොයිබටදෝ
දිය සුළි දිය රැළි පිරුණු ගඟයි.

★ රොන් මැස්සෝ රොන් ගෙනෙති
මුර මැස්සෝ මුර කරති
සෙසු මැස්සෝ වද හදති
එකමුතු වී වැඩ කරති.

**<u>නාට්‍යයේ හාස්‍ය රසය මතුවන තැන් කීපයක්,</u>**

- මී වද පෙට්ටිය කර තියාගෙන යන වළහා අතරමගදී මී වද කෑමට යන විට මාෂා කථා කිරීම.
- මාෂා වළහගේ නිවසේ සිටින විට වළහා පැමිණීම.
- නාට්‍ය අවසානයේ ආච්චි වළහා දැක.වළහා හා ආච්චී දිවීම ,
- ඔවුන් එකිනෙකා මුණ ගැසෙන අයුරු.

**<u>නාට්‍යයේ ගැටුම් අවස්ථා කීපයක්,</u>**

- මාෂා කැලේ අතරමං වීම.
- මාෂා වළහාගේ නිවසේ සිටින විට වළහා නිවසට පැමිණීම.
- වළහා අතරමග දී මී වද කෑමට උත්සාහ කරන අවස්ථාව.

**<u>විවිධ අවස්ථා තුළින් ජීවිතට ගත හැකි පාඩම්,</u>**

- වළහගේ නිවස තුළින් නිවසක තිබිය යුතු පිළිවෙල හා -අලංකාර බව .
- වළහා මාෂාව පන්නා ගිය පසු ආච්චි වළහට කතාකර ස්තූති කරන අවස්ථාව කළ උපකා -රයට ස්තූති කල යුතුය යන්න.
- මාෂාට මී මැස්සන් මුණ ගැහුණ අවස්ථාව- සතුන්ට හිංසා කිරීම හොද නැති බව පිළිගනී.



**ඇගයීම:**

- මාෂා සහ වළහා නාට්‍යයේ ඇති තේමාවන් මොනවාද?
- මෙම නාට්‍යට පාදක වූ රුසියානු ජන කතාව කෙටියෙන් ලියන්න.
- මෙම නාට්‍ය පෙළ කියවා රස විඳින්න.